පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# දෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

## පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 4 | 21 | 2 | 31 | 2 |
| 2 | 2 | 12 | 1 | 22 | 1 | 32 | 3 |
| 3 | 4 | 13 | 2 | 23 | 3 | 33 | 1 |
| 4 | 3 | 14 | 3 | 24 | 4 | 34 | 4 |
| 5 | 3 | 15 | 1 | 25 | 4 | 35 | 3 |
| 6 | 2 | 16 | 1 | 26 | 3 | 36 | 2 |
| 7 | 3 | 17 | 1 | 27 | 1 | 37 | 4 |
| 8 | 1 | 18 | 4 | 28 | 4 | 38 | 3 |
| 9 | 4 | 19 | 2 | 29 | 2 | 39 | 1 |
| 10 | 3 | 20 | 4 | 30 | 3 | 40 | 4 |

### II කොටස

01.

I. චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

II. මංගලම් සිංදුව ගායනා කිරීමෙනි.

III. කාලගෝල, දික්තලා, දික්පිටියා තනි තනිව ප්‍රශ්න කිරීමෙනි.

IV.

- ගඟෙන් එතෙර වන අවස්ථාව.
- පොතේ ගුරෙකු සිටීම.
- පූර්ව රංගයක් තිබීම.
- අවකාශය වෙනස් කිරීම සඳහා පරික්‍රමණය භාවිත කිරීම.
- ආංගික අභිනයේ දී නිශ්චිත මුද්‍රා භාවිත කිරීම.

V. දික්තලා හා කාලගෝල අතර.
කාලගෝලට හා දික්තලාට දික්පිටියා මුණගැසීම.
මහෞෂධ පඬිතුමා නඩුව විසඳන අවස්ථාව.

VI. මව - දික්සුරඟී
පියා - හේතුපානි

02.

I. ප්‍රේක්ෂකයා ඉදිරියේ ඒ මොහොතේම නළු නිළියන් ලවා වේදිකා නාට්‍යයක් වේදිකා ගත කරන බැවිනි.

II. ලෝකධර්මී - කැළණි පාලම, චෙරිවත්ත, තට්ටුගෙවල්, රූකඩ ගෙදර, බෝඩිංකාරයෝ, තලමල පිපිලා

නාට්‍යධර්මී - මනමේ, මහාසාර, සිංහබාහු, පෙමතෝ ජායතී සෝකෝ, හුණුවටය, නරිබෑනා

III.

- නාට්‍ය කලාවෙහි දකින සජීවී බව.
- රංග කාලයේ සහ අවකාශ භාවිතයෙහි සීමා සහිත බව.
- වේදිකාව මත රූපණය කළ හැකි දේ පමණක් තෝරා ගැනීම.
- ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම.
- චිත්‍ර, සංගීත, නර්තනය වැනි කලා මාධ්‍යයන් නාට්‍ය හා දායක කර ගැනීම.
- සක්‍රීය ප්‍රේක්ෂක සහභාගිත්වය
- නැවත නැවතත් නිර්මාණය වෙනස් කළ හැකිවීම.
- එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය වීම.
- සෑම දර්ශන වාරයකම නාට්‍ය නිෂ්පාදනයට දායක වූ පිරිස් ප්‍රතිලාභ ලැබීම.
- ගබඩා කර ගත නොහැකි වීම.

03.

I. සාර්ථක නාට්‍ය පිටපතක් තෝරා ගනිමින් නළු නිළියන් හා ආනුෂංගික ශිල්පීන් යොදවා ගෙන වේදිකාවක් මතට ගෙන ඒමේ සාමුහික ක්‍රියාවලිය මෙහෙය වන්නා වේ.

II.

- නිවැරදි නළුවරණයක් සිදු කිරීම.
- සාර්ථක නාට්‍ය පිටපතක් තෝරා ගැනීම හෝ රචනා කිරීම.
- නාට්‍ය ශෛලීන් ගැන අවබෝධය.
- නාට්‍ය කලාවේ සීමා හා ශක්‍යතා හඳුනාගැනීම.
- සාමුහිකව කටයුතු කළ හැකි සුහදශිලී පුද්ගලයකු වීම.
- ප්‍රේක්ෂක රුචිකත්වය වටහා ගැනීම.

III.

1. නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම.
2. නිෂ්පාදනය පිටපත සකස් කිරිම.
3. නළු වරණය.
4. පිටපත කියවිම.
5. ආනුෂංගික ශිල්පින් තෝරා ගැනීම.
6. පුහුණු වීම.
7. ආනුෂාංගික ශිල්පින් සුසංයෝගී කිරීම.
8. රඟුම් පාලක මණ්ඩලයෙන් අවසර ලබා ගැනීම.
9. සවේශ පුහුණුව.
10. මංගල ප්‍රදර්ශනය පැවැත්වීම.

04.

I. දහඅට සන්නිය හෙවත් සන්නි යකුම

පහතරට සම්ප්‍රදාය

II.

- සන්නි 18 දෙනාගේ පැමිණීම.
- පාලි 18 ක් පැමිණීම.
- සූනියම් යක්ෂණියගේ පැමිණීම.
- මහා කෝල සන්නි යක්ෂයාගේ පැමිණීම.

III. සූනියම් යක්ෂණියගේ පැමිණීම.

මෙම අවස්ථාවේ දී ගැහැණු වෙස් ගත් පිරිමි යකැදුරෙකු අවස්ථා තුනක දී වේදිකාවට පැමිණේ.

1. තරුණ කාන්තාවක් ලෙස.
2. ගැබිගත් කාන්තාවක් ලෙස.
3. දරුවෙකු අතින් වඩාගත් කාන්තාවක් ලෙස.

තරුණ කාන්තාවක් ලෙස - මෙහිදි තරුණ වෙස් මුහුණක් පළඳී. බෙර වාදනයට අනුව රංගනයේ යෙදේ. යකැදුරා සමඟ සංවාදයේ යෙදේ.

උදා : යකැදුරා :- කරකවනවා වැඩියි... යාපනේ භූමිකම්පාව වගෙයි....

දෙවන අවස්ථාවේ දී ගැබිගත් කාන්තාවක් ලෙස වෙනත් වෙස් මුහුණක් දමා ගනිමින් වේදිකාවට පැමිණේ.

උදා : යකැදුරා :- කොහෙද යන්නෙ...

යක්ෂණිය :- මං යන්නෙ ඉස්පිරිතාලෙට......

තුන්වන අවස්ථාවේ දී දරුවෙකු ලෙස දඬුරුවක් භාවිත කරමින් තරුණ වෙස් මුහුණ දමාගෙන වේදිකාවට පැමිණේ.

මෙහිදි මුඛරි සංවාද භාවිත කරයි. සියලු ක්‍රියා අනුකරණය කර දක්වයි. රංගභාණ්ඩ භාවිත කරන අතර පිරිමි යකැදුරා ස්ත්‍රියක් ලෙස සමාරෝපය වේ. එකිනෙකාට වෙනස් හැගිම් පළකරන්නා වූ වෙස් මුහුණු භාවිත කිරීම විශේෂ ලක්ෂණයකි. සතර අභිනය භාවිත වේ.

මේ ආකාරයට මෙහි නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කළ හැකි වේ.

05.

I. ආහාර්ය අභිනයට

II. ප්‍රභේද 2කි.

1. සරල අංගරචනය
2. චරිතාංග අංගරචනය

සරල අංගරචනය යනු ඃ- නළු නිළියන්ගේ පවත්නා ස්වාභාවය ඒ අයුරින් ම පෙන්වීම.

චරිතාංග අංගරචනය යනු ඃ- චරිතයට අදාල පරිදි පුද්ගලයාගේ බාහිර පෙනුම වෙනස් කිරිමයි.

III.

- නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම.
- නාට්‍ය අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කිරීම.
- නාට්‍යයේ ශෛලීය, නිරූපිත කාලය, දේශය, යුගය පිළිබඳ අවබෝධයක් ලැබීම.
- පුද්ගල හා සත්ත්ව චරිත පිළිබඳ සැලකිලිමත් වීම.
- අංගරචන ශිල්පියා හා සම්බන්ධ වන අනෙකුත් ආනුෂංගික ශිල්පීන් සමඟ සාකච්ඡා කිරීම.
- චරිත ස්වභාවය අධ්‍යයනය කිරීම.
- අනුමත ද්‍රව්‍ය පමණක් යොදා ගත යුතු වීම.
- චරිතයට ගැලපෙන පරිදි අංගරචනය සිදු කිරීම.

06.

I. සුගතපාල ද සිල්වා

II. එකවල්ලේ පොල්, බෝඩිංකාරයෝ, තට්ටුගෙවල්, නන්දි විශාල, දැවැද්දෝ, සත සහ සත, සාන්තුවර සෙබළාණෝ

III.

- ලෝකධර්මී නාට්‍ය කලාවේ පුරෝගාමීයා වීම.
- ශ්‍රී ලාංකීය නාට්‍ය කලාවේ උසස් දියුණුවක් සිදු කිරීම.
- තට්ටුගෙවල්, බෝඩිංකාරයෝ වැනි ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදනය කිරීම.
- හිත හොඳ අම්මණ්ඩි, මුතු කුමාරි ආදී පරිවර්තන නාට්‍ය සිදු කිරීම.
- ටෙලි නාට්‍ය, චිත්‍රපට තිර රචනයෙහි යෙදීම.
- නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ ව සොඳුරු '' ආඥාදායකයා '' නමින් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් රචනා කිරීම.
- මොහු නාට්‍ය රචකයකු, අධ්‍යක්ෂකවරයකු පමණක් නොව උසස් නවකතා රචකයකු වීම.